# යල කන්නය අස්වද්දන්න ශ්‍රී ලංකාවට ඉන්දියාවෙන් යූරියා මෙට්‍රික් ටොන් 65,000ක්

**මහින්ද අලුත්ගෙදර**

එළඹෙන යල කන්නයේ පොහොර අවශ්‍යතාවය වෙනුවෙන් යූරියා මෙට්‍රික් ටොන් 65,000ක් කඩිනමින් ශ්‍රී ලංකාවට දීම සඳහා ඉන්දියාව එකඟතාව පළකැර තිබේ.

ඉදිරි යල වගා කන්නයේ වී වගාව සඳහා අවශ්‍ය යූරියා සැපයීම පිළිබඳ සාකච්ඡා කර තීරණ ගැනීම සඳහා නවදිල්ලියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් මිලින්ද මොරගොඩ මහතා ඊයේ (12) ඉන්දියාවේ ජාතික පොහොර දෙපාර්තමේන්තුවේ ලේකම් රාජේෂ් කුමාර් චතුර්වේදි මහතා හමු වී සාකච්ඡා කැර තිබේ.




මෙම කන්නයේ වී සඳහා යූරියා මෙට්‍රික් ටොන් 65,000ක් අවශ්‍ය වනු ඇති අතර දෙරට අතර දැනට පවතින අමෙරිකානු ඩොලර් බිලියනයක ණය පහසුකම යටතේ වහාම ශ්‍රී ලංකාවට පොහොර සැපයීමට ඉන්දීය රජය තීරණය කැර ඇත. එයට අදාළ ඉදිරි සැපයුම් සම්බන්ධව මෙම හමුව සිදු වූ බවද ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය පවසයි.

ඉන්දියාවෙන් යූරියා අපනයනය තහනම් කර ඇති අතර එරට අවශ්‍යතා සඳහා පාලනය කර ඇති තීරණය තාවකාලිකව ඉවත් කරන්නට ඉන්දීය බලධාරීහු මෙහි දී එකඟත්වය පළ කර ඇත.

කොළඹ සිටින ඉන්දීය මහ කොමසාරිස් ශ්‍රී ගෝපාල් බග්ලේ මහතා සමඟ සාකච්ඡා කර යූරියා මෙට්‍රික් ටොන් 65,000ක් ශ්‍රී ලංකාවට සැපයීමට අවශ්‍ය අනුමැතිය සහ ප්‍රවාහන පහසුකම් සැලසීම සම්බන්ධයෙන් මහ කොමසාරිස් මිලින්ද මොරගොඩ මහතා පොහොර දෙපාර්තමේන්තුවේ ලේකම් චතුර්වේදි මහතාට මෙම හමුවේදී ස්තුතිය පුද කෙළේය.

ඊට ප්‍රතිචාර වශයෙන් ශ්‍රී චතුර්වේදි මහතා පෙන්වා දුන්නේ, ඉන්දියාවේ 'අසල්වැසියාට ප්‍රථම' ප්‍රතිපත්තියට අනුකූලව ශ්‍රී ලංකාවට සහාය දැක්වීමට තම දෙපාර්තමේන්තුව සැමවිටම සූදානම් බවත්, අවශ්‍ය යූරියා ප්‍රමාණය ශ්‍රී ලංකාව ආසන්නයේ පිහිටි ඉන්දියාවේ වරායක සිට නැව්ගත කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කරමින් සිටින බවත්ය.

දැනට පවතින ණය මාර්ගය යටතේ සහ ඉන් ඔබ්බට ඉන්දියාවෙන් ශ්‍රී ලංකාවට රසායනික පොහොර අඛණ්ඩව සැපයීම සහතික කිරීමේ සැලැස්මක් ද මහ කොමසාරිස්වරයා සහ ලේකම්වරයා සාකච්ඡා කළහ. මහ කොමසාරිස් මොරගොඩ, නියෝජ්‍ය මහ කොමසාරිස් නිලූක කදුරුගමුව, ඇමැති උපුල් පුෂ්පකුමාර සහ ඇමැති උපදේශක ගාමිණී සරත් ගොඩකන්ද මහත්වරු ද මෙම සාකච්ඡාවට එක්ව සිටියහ.